# විලාසිතාවන්හි සමාජ මනෝවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳ සංඥාර්ථවේදී විග්‍රහයක්

**දිනීෂා ලියනගේ**

**සංක්ෂේපය**

ඕනෑම සංස්කෘතියකට යටත්ව දෙන ලද කාලයකට අනුව ප්‍රචලිතව පවතින ඇඳුම්-පැලඳුම් ආකාරයන් විලාසිතා ලෙස සරලව අර්ථකථනය කළ හැකිය. සමාජ මනෝවිද්‍යාව යනු මිනිසාගේ සිතුවිලි හැඟීම් සහ හැසිරීම්වලට අන්‍යයන්ගේ පැවතීම, සිතෙහි මවා ගැනීමේ ක්‍රියාවලිය හෝ ඒ පිළිබඳ හැඟීයන අයුරු බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීමකි. සංඥාර්ථවේදය යනු ඕනෑම භාෂාවක පවතින සංඥා සංකේත අධ්‍යයනය කිරීම මගින් අර්ථ උත්පාදනය කොට ගැනීමයි. මෙමඟින් අවධානය යොමු කරනු ලබන්නේ විලාසිතාවන්හි සමාජ මනෝවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳව සංඥාර්ථවේදී විග්‍රහයක් සිදු කිරීම උදෙසාය.

## හැඳින්වීම

වර්තමාන ලෝකයේ මූලික ධනෝපායන මාර්ග අතර විලාසිතා නිර්මාණය හා ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රමුඛත්වයෙහිලා හඳුනාගත හැකිය. විලාසිතාකරණය වර්තමානය වන විට නිර්මාණශීලිත්වය ඔස්සේ අධ්‍යයනය කරනු ලබන විෂය පරාසයක් දක්වා පුළුල් වී තිබේ. විලාසිතා නිර්මාණ ආයතන ලෝකය පුරා නව නිර්මාණ සංකල්ප ඔස්සේ විලාසිතාකරණය සඳහා පෙළඹී තිබීම ඔස්සේම විලාසිතාකරණය කෙරෙහි වත්මන් ලෝකයේ පවතින නැඹියාව පිළිබඳ විශ්ලේෂණය කළ හැකිය. සාමාන්‍ය ව්‍යවහාරයේදී විලාසිතා යන්න "වඩාත් නූතන ඇඳුම්-පැලඳුම් ක්‍රමවේද" වශයෙන් හඳුන්වා දිය හැකිය. පොදුවේ ගත්කළ විලාසිතා විෂය ක්ෂේත්‍රය බහු විෂයන් සමඟද ඍජු සම්බන්ධතාවයක් දක්වයි. සන්නිවේදනය

භූගෝල විද්‍යාව

සමාජ විද්‍යාව

ජනශ්‍රැතිය අධ්‍යයනය

ඉතිහාසය

පුරා විද්‍යාව

දර්ශනය

මනෝවිද්‍යාව

එහි දිගුව සාමාන්‍ය ඇඳුම්-පැලඳුමක සිට ඉතිහාස ගවේෂණය, පුරාවිද්‍යාව ඔස්සේ විවිධ පෞරාණික ස්ථර අධ්‍යයනය දක්වා වූ විෂය පරාසයක් තරමටම පැරණි සහ ගැඹුරුය. බැලූ බැල්මට පුහු අර්ථකථනයකට නැකම් ඇති "විලාසිතා" යන වචනය වර්තමානය වන විට බොහෝ විද්වතුන්ගේ විමර්ශනාක්ෂියට හසුවන වැදගත් වෘත්තීමය තත්ත්වයක් දක්වන අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට පත්වී ඇත. නිව්යෝක්, මිලාන්, පැරිස්, ලන්ඩන්, ලොස් ඇන්ජලීස්, ටෝකියෝ, සාවෝපෝලෝ, සිඩ්නි, සහ ඩුබායි යන නගර ලෝකය පුරා විලාසිතා නගර වශයෙන් ප්‍රචලිතය. දිගින් දිගටම නව අත්හදා බැලීම් ඔස්සේ විලාසිතා පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කරන මෙම නගරයන්හි නිර්මාණය කරන ඇතැම් ඇඳුම්-පැලඳුම් විලාසිතා සාමාන්‍ය ජනයාට මිලදී ගැනීමට සිතීමටත් නොහැකි තරමටම මිලාධිකය. විලාසිතාවක අවශ්‍යතාවය තීරණය කෙරෙන සාධක ද්විත්වයකි.එනම්,

- ජීව විද්‍යාත්මක සාධක

- භෞතික සාධක වශයෙනි.

ජීවවිද්‍යාත්මකව අව්ව, වැස්ස මෙන්ම විවිධ උපද්‍රවවලින් ආරක්ෂා වීම සඳහා මානවයාට ඇඳුම් අත්‍යවශ්‍ය විය. ලෝකය සංවර්ධනය කරා ගමන් කරන විට භෞතික වත්-පොහොසත්කම් පෙන්වන සාධකයක් බවට ඇඳුම්-පැලඳුම් ක්‍රමවේද නැවත පත් විය. එමෙන්ම විලාසිතා යනු එක් අතෙකින් සංස්කෘතික අධ්‍යයනය විෂයෙහිලා භාවිතයට ගතහැකි අංගයකි.

"සමාජයේ සාමාජිකයෙක් වශයෙන් මිනිසා විසින් අගය කරන්නා වූත් පරිණතවූත් දැනුම, විශ්වාසය, කලා, සදාචාර ධර්මයන්, නීතිය, සිරිත හා අනෙකුත් සියළුම හැකියාවන්වල සංකීර්ණ සමස්තය සංස්කෘතියයි. -ඊ.බී. ටයිලර්-

සංස්කෘතිය යන්න තුළ ඊ.බී. ටයිලර්ගේ නිර්වචනයෙන් කුලුගන්වන සමස්තයේදී මෙකී විලාසිතාකරණය යන්න ඍජුවම සම්බන්ධතාවයක් දක්වයි. එමගින් හැඟී යන්නේ විලාසිතාකරණය සමඟ සංස්කෘතිකමය බලපෑම යන්න එකිනෙකට සම්බන්ධව පවතින ආකාරයයි. මිනිසාගේ ජීවිතයේ ජීවන රටාවට අයත් ආර්ථික චර්යා, සමාජ චර්යා, දේශපාලන චර්යා, මෙන්ම ආගමික චර්යාව ආදී සියල්ලම සංස්කෘතියට අයත් වෙයි. ඒ ඔස්සේ මනුෂ්‍යයා එදිනෙදා භාවිතයට ගනු ලබන සියලුම භාණ්ඩ ආදිය පවා සංස්කෘතියට සම්බන්ධ වේ. ඇඳුම්-පැලඳුම් ආකාර එහිදී සුවිශේෂිය. ඒවා සෑම විටම යම් සංස්කෘතියක් පිළිබඳව විවරණය කරයි.

"Fred Davis" ගේ අර්ථ දැක්වීමට අනුව විලාසිතා හඳුනා ගැනීමේදී එහි සැඟවී පවතින දැනුම පිළිබඳවද අවධානය යොමු කළ යුතුය. විචාර බුද්ධියකින් තොරව කිසිවෙකුට විලාසිතා කියවිය නොහැකිය. විලාසිතාවන්හි ඇතුළත් රේඛා, වර්ණ, හැඩතල මෙන්ම අනෙකුත් ලක්ෂණයන්ද එම විලාසිතාව අයත් සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ අවබෝධකර ගැනීමට ඉවහල් වෙයි. විලාසිතා සංස්කෘතික වශයෙන් එකිනෙකට වෙනස් සංඥාර්ථ උද්දීපනය කරයි.

සමාජ මනෝ විද්‍යාව මඟින් පුද්ගලයාගේ, හැඟීම්, සිතුවිලි, හැසිරීම්, චර්යාවන් කෙරෙහි අවධානය යොමු කරණු ලැබේ. සිතුවිලි, හැසිරීම්, හැඟීම්, චර්යාවන් මැනීම මඟින් පුද්ගලයා මැනිය හැකි සියලු කෝණ විවරණය වෙයි. එමෙන්ම සමාජ මනෝ විද්‍යාවේදී මිනිසුන්ගේ චර්යාත්මක අධ්‍යයනය පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කරනු ලැබේ. "චර්යාව යනු මිනිසා සහ

පරිසරය අතර ක්‍රියාකාරිත්වයයි. - කර්ට් ලුවින්ස් (1951) - මෙකී චර්යාත්මක අධ්‍යයනය ඔස්සේ සමාජ මනෝ විද්‍යාවේ අධ්‍යයනය විෂය පරාසය වඩාලාම පහසු කරයි. එක් අතකින් සමාජ මනෝ විද්‍යාව යනු සමාජ විද්‍යාව සහ මනෝ විද්‍යාව ඒකාබද්ධ වූ විෂය පරාසයක් වශයෙන්ද හඳුනාගත හැකිය. " සමාජ මනෝ විද්‍යාව යනු සමාජ තත්ත්වයන් තුළ තනි තනි හැසිරීම් ස්වභාවය හා හේතූන් තේරුම් ගැනීමට උත්සාහ කරන විද්‍යාත්මක ක්ෂේත්‍රයකි". - Byrne සහ Suls 1989- සමාජ මනෝවිද්‍යාව අධ්‍යයන විෂය පරාසය තුළ පහත සඳහන් සංකල්ප කෙරෙහි වැඩිදුරටත් අවධානය යොමු කරනු ලැබේ.

- ස්වයං සංකල්පය
- සමාජ දැනීම
- ආරෝපන න්‍යාය
- සමාජ බලපෑම
- කණ්ඩායම් ක්‍රියාවලි
- අගතිය සහ වෙනස්කම්
- අන්තර් ක්‍රියාවලිය
- ආකල්ප
- ඒකාකාර ස්වභාවය
- චණ්ඩභාවය

සමාජ මනෝවිද්‍යාව පිළිබඳ සංකල්පය විග්‍රහ කිරීමේදී වැඩිදුරටත් මනස යන සාධකය ප්‍රබලත්වයෙහිලා සැලකෙයි. සමාජය සමාජ මනස වර්ධනය කිරීම සමඟ නොවැළැක්විය හැකි සබඳතා ඇති බව වැදගත් වූ අතර එහිදී සමාජ මනෝවිද්‍යාව පිළිබඳ අධ්‍යයනයේ දී මනස යන සාධකය වැදගත් වෙයි. -හේගල් (1770-1831)- සෑම විටම පුද්ගලයාගේ චින්තනයේ ස්වරූපය අනුව මෙකී සමාජ මනෝවිද්‍යාත්මක සාධක බලපෑම් කරයි. සමාජ මනෝ විද්‍යාත්මක අධ්‍යයනයේදී ඇමෙරිකානු අධ්‍යයනවේදීන් වැඩිදුරටත් පුද්ගලයින් ඉලක්ක කර ඇති අතර යුරෝපීයානුවන් වැඩිපුරම කණ්ඩායම් යන සාධකය කෙරේ අවධානය යොමුකර ඇත.

විලාසිතාවන් කෙරෙහි අවධානය යොමු කිරීමේදී එහි සමාජ මනෝ විද්‍යාත්මක පැතිකඩ පිළිබඳ විග්‍රහය කරන විට පෙනී යන්නේ මෙකී සමාජය පිළිබඳ සංකල්පය තුළ පවතින සියලුම අනු විෂයික පරාස සමග එහි නෛසර්ගික සම්බන්ධාතවයක් පවතින ආකාරයයි. විලාසිතා යනු සංස්කෘතියේ නිර්දේශකයක් බවට පත්වීම පිළිබඳ පොදු මතය මෙහිදී සනාථ වෙයි. "සමාජ හා මානව විද්‍යාඥයන් විසින් සංස්කෘතිය යන්න විග්‍රහකිරීමේදී සංස්කෘතිය යන සංකල්පය සමාජ සංවිධානය හා සම්බන්ධ කරගනිමින් පැහැදිලි කර තිබේ". -"මලිනොවුස්කි" හා "ප්‍රාන්ස් බොආස්" මානව විද්‍යාඥයන්-

මලිනොවුස්කිගේ අවධාරණයට අනුව පුද්ගලයාගේ ජීව මනෝ ප්රේරණයන් සංතෘප්තිමත් කිරිමේදී මෙම සංස්කෘතික අවශ්‍යතා ඉතා වැදගත් වේ. මෙකී නිර්වචනය ඔස්සේ විලාසිතාකරණයේ සමාජ මනෝ විද්‍යාත්මක පැතිකඩ විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ, මුල් කාලීන ඇඳුම් මිනිසාගේ නිරුවත වසා ගැනීම, පාරිසරික භූගෝලීය තත්ත්වයන්ට ඔරොත්තුදීම, ආදී අරමුණු කිහිපයකට යටත්ව තිබුණද පසුකාලීනව ඒවා සංස්කෘතික, සමාජීය අවශ්‍යතා උදෙසා නිර්මාණය කරගන්නට තරම් මානවයා පෙළඹී ඇති බවයි. විවිධ සමාජවල ඇඳුම් රටා එකී සමාජයන්හි සමාජ තත්ත්වය, කුල ක්‍රමය, විවිධ සමාජ ස්ථර ආදිය මෙන්ම භූගෝලීය වශයෙන් වෙනස් වූ සාධක පවා විවරණය කරනු ලබන ආකාරය අධ්‍යයනය කිරිමේදී උක්ත කරුණු අවබෝධ කර ගැනීම වඩාත් පහසුය. වර්තමානය වන ඇඳුම සමාජ පන්තිය, සමාජ බලය යන සාධක තහවුරු කරන සංඥාවක් බවට පත් වී ඇත.

"ඉහළ සමාජ තත්ත්වයේ ස්ත්‍රී පාවැසුම්වල ඉතාම විශිෂ්ට ආදර්ශය 2003 දී පැවති ප්‍රදර්ශනයේ ඉදිරිපත් කෙරිණ. ඒ "සුටුවාට් වෙයිට්ස්මාන්" නමැති මොස්තර නිර්මාණ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද "ද විසාර්ඩ් ඔෆ් වූස්" හි ඉන්ද්‍රජාලික පද්මරාග සෙරෙප්පුවලින් ප්‍රබෝධනය කරන ලද විශේෂ ප්ලැටිනම් ගෙත්තමක් තුළ රතු කැට 642 ක් ඔබ්බන ලද දිගු පටු අඩි සහිත පාවැසුම් කුට්ටමකි. එය පවුම් මිලියනයක (ආසන්න වශයෙන් ඩොලර් මිලියන 1.5 ක) මිලකට විකිණීමට තබා තිබිණි". - Desmond Morris,The Naked Women-


ඇඳුම සමාජ මනෝ විද්‍යාව පිළිබඳ ප්‍රකාශයක්ය. යන කාරණය සමග එකඟ වීමේදී පහත සඳහන් කරුණ කෙරෙහි මූලික අවධානය යොමු කළ හැකිය.

-විවිධ අවශ්‍යතා සඳහා අඳින ඇඳුම්වල පවතින විවිධ වෙනස්කම්,

උදා- විවාහය, මළ ගෙදර, සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම වැනි විවිධ අවස්ථාවල අඳින ඇඳුම් එකිනෙකට සම්පූර්ණයෙන්ම වෙනස්ය.

"ඇඳුම් විලාසිතා සැම විටම මානවයා කෙරෙහි වැදගත් වන ප්‍රධාන අංග ද්විත්වයක් හඳුන්වා දිය හැකිය. එහිදී ශාරීරික සන්නිවේදනයක්ද ඇඳුම මගින් පිළිබිඹු කරයි. එය ශාරීරික සහ සාමාජීය වශයෙන් ද්වි ආකාරව වැදගත් වෙයි". -Marry Ellen Roach Higging and Joanne Eicher (1992)-

විලාසිතාකරණයේ සමාජ සංස්කෘතික පරිසරය පිළිබඳ අවධානය යොමු කරනවිට එහි පවතින ශාරීරික අවශ්‍යතා, සහ සාමාජීය අවශ්‍යතා යන සාධක ද්විත්වය ඉතා වැදගත්ය.



උදාහරණයක් වශයෙන් දැඩි සීතලට ඔරොත්තු දීම සඳහා අත් මේස් පැලඳීමත්, හිම කබා පැලඳීම ආදිය මෙන්ම සූර්ය රශ්මියෙන් ආරක්‍ෂා වීම සඳහා තොප්පි, කබා ආදිය පැලඳීම මඟින් ඇඳුමේ පවතින ශාරිරික අවශ්‍යතා පිළිබඳ අවධාරණය කළ හැකිය. නමුත් ඊට හාත්පසින්ම වෙනස් අරමුණු උදෙසා නිය ආලේපන ගැල්වීම, විසිතුරු විලාසිතා සහිත ඇඳුම් ඇඳීම ආදියද සිදු කරයි. එය සමාජ බලය පිළිබඳ සාධකය පිළිබඳ විග්‍රහ කරයි. නමුත් මේ පිළිබඳව විමසීමේදී එහි සංස්කෘතික මුහුණුවරක් ද තිබෙන බව හඳුනාගත හැකිය. ඇඳුම් මෙන්ම ඕනෑම පැලඳුම් ස්වරූපයක් කෙරෙහිද මෙම සංස්කෘතික මුහුණුවර භාවිත වෙයි. "අප්‍රිකාව තුළ විශාල තොල් තැටි බහාලීමත්, ජපාන අයිනු ගෝත්‍රය තුළ තොල් පච්චා කෙටීමත් ග්‍රෝතික තොල් අලංකරණයන් තුළ දැකිය හැකිය. ඇතැම් අප්‍රිකානු ගෝත්‍රයන් තුළ කාන්තාවකගේ වටිනාකම ඇයගේ තොල් තැටියේ විශාලත්වය අනුව මනිනු ලැබේ". - Desmond Morris,The Naked Women-

"සිග්මන් ෆ්‍රොයිඩ්ගේ" මනෝ විශ්ලේෂණවාදයට අනුව ළදරු කළ සිටම '' ජීවත් වීමේ ආශාවන්'' මනුෂ්‍යයා තුළ ඇති වෙයි . එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා නිතර සුබ වේදනය,සංතර්පනය තෘප්තිය හෝ අශ්වාදය උදෙසා වෙහෙසෙයි. ඒ අනුව මේ අවශ්‍යතා සංතෘප්ත කර ගැනීම මනුෂ්‍යයාගේ ඒකායන පරමාර්ථ බව "ෆ්‍රොයිඩ්" වැඩි දුරටත් විග්‍රහ කරයි. වර්තමාන ලෝකයේදී ඇඳුම්-පැලඳුම්ද මිනිසාගේ අතෘප්තිමත් ආශාවක් බවට පත් වී ඇත. විලාසිතා ලුහුබැඳ යාම මෙකී තෘප්තිය හෝ ආශ්වාදය යන පරමාර්ථ ඉටු කර ගැනීමේ අරමුණෙහි ප්‍රතිඵලයයි.

මේ ආකාරයට ඇඳුම්-පැලඳුම් ආකාර ශාරිරික ආරක්‍ෂාව උදෙසා මෙන්ම සංස්කෘතික වටිනාකම් නිරූපණය ආදී විවිධ පරාසයන්හි අන්තර්ගත වීම අධ්‍යයනය කළ හැකිය. සමාජීය වශයෙන් ලිංගිකත්වය පිළිබඳ සංඥාර්ථ උද්දීපනය කිරීමටද ඇඳුම සතු වන්නේ සුවිශේෂී හැකියාවකි. 1992 දී "ජොන්සන් සහ වෝක්මන්" යන පර්යේෂකයන් දෙදෙනා විසින් කාන්තාවන් ලිංගික හිරිහැරවලට ලක් වීම කෙරෙහි ඔවුන්ගේ ඇඳුම්-පැලඳුම් බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව පර්යේෂණයක් සිදු කරන ලදි. එහිදී අවධාරණය වූයේ අඳුරු වර්ණ සහිත උඩුකය වසන ඇඳුම්, අත් රහිත බ්ලවුස්, දණහිස දක්වා කෙටි සාය මෙන්ම අඩි උස සපත්තු ආදිය ඇඳ සිටීමෙන් කාන්තාවන් ලිංගික අතවරවලට මුහුණදෙන ප්‍රතිශතය ඉහළ යන බවයි. මෙමඟින් පෙනී යන්නේ ඇඳුම මඟින් ගොඩනංවනු ලබන සංඥාවන්හි විවිධත්වයයි.

මිනිසුන් ජීවිතයේ සෑම මොහොතකදීම ශ්‍රව්‍ය දෘශ්‍ය ආදී ඕනෑම සන්නිවේදනයකදී ද සංඥාර්ථවේදය සමග සම්බන්ධ වෙයි. සංඥාර්ථවේදය වාග් විද්‍යාව, සෞන්දර්ය විද්‍යාව, කාව්‍ය ශාස්ත්‍රය, අවාචික සන්නිවේදනය, ඥාන විභාගය මෙන්ම ජීව විද්‍යාව සමඟ සම්බන්ධ වූ විෂය ක්ෂේත්‍රයකි. භාෂාව සංඥා සංකේතවලින් සෑදුම් ලද්දක් යැයි ප්‍රකාශ කරන අදහස හා සංඥාර්ථ විද්‍යාව සම්බන්ධ වෙයි. සංඥාර්ථ විද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ සංඥාවකට නියත අර්ථයක් නොමැති බවයි. එය සංඥාව ලබාගන්නා නිශ්චිත පාඨක කණ්ඩායමේ සංජානනය හා සමාජ සන්දර්භය අනුව බලපැවැත්වෙන බවයි.

විවිධ සමාජ කණ්ඩායම් විවිධ චින්තක රටාවන් සේම විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ ජීවත් වෙයි. ඒ ඔස්සේ සිතයි. ඇතැම් විටෙක පොදු සංස්කෘතික කණ්ඩායම් තුළ උප සංස්කෘතික ලක්‍ෂණ සහිත ජන කොට්ඨාසවල ජීවත්වන මිනිසුන්ද සිටිය හැකිය. සංඥාර්ථ හඳුනාගැනීමේදී ඒ ඒ

ජන කොට්ඨාශවල චින්තන රටාවන් සමාජීය රටාවන් පවා බලපායි. සංඥාර්ථ අර්ථකථනයේදී ඒ කෙරෙහි පුද්ගලයන්ගේ මතවාදයද දැඩි ලෙස සම්බන්ධතාවයක් දක්වයි.

උදාහරණයක් වශයෙන් කොට ගවුම් විලාසිතාව නාගරික පරිසරයකදී අලංකාරය මෙන්ම විචිත්‍රවත් බව හඟවයි. නමුත් එම කොට ගවුම් විලාසිතාවම ග්‍රාමීය පරිසරයකදී අසංවරබව, නොගැලපීම, නොහැදියාව වැනි සංඥා උද්දීපනය කරයි.

විලාසිතාකරණයේ සංඥාර්ථ අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ සෑම ඇඳුම්-පැලඳුම් ක්‍රමයක් මඟින්ම මෙකී සංඥාර්ථ උද්දීපනය වන බවයි. ඒ ඔස්සේ විවිධ පුද්ගලයින් අනෙකාව අවබෝධකර ගැනීම වටහා ගැනීම මෙන්ම ඔහු හෝ ඇය පිළිබඳව යහපත් මෙන්ම අයහපත් ආකල්ප ගොඩ නගා ගැනීමටත් මෙකී සංඥාර්ථ බලපායි.

## විලාසිතා

විලාසිතාකරණය යන්න පැරණි සාම්ප්‍රදායික නොදියුණු සමාජයේ සිට මේ දක්වා වෙනස් වෙමින් විපරිත වෙමින්, සංකලනය වෙමින් වෙනස් වූ විෂය පරාසයක් ලෙස හඳුනාගත හැකිය.

විලාසිතා යන වචනය ඇඳුම්-පැලඳුම්, ආභරණ, හිස්වැසුම්, පාවහන් ආදි ස්ත්‍රී පුරුෂ ඇඳුම්-පැලඳුම් සේම කලාව, ගෘහනිර්මාණ ශිල්පය ආදි ක්ෂේත්‍රයන් උදෙසාත් භාවිත කළ හැකිය. මලලසේකර ශබ්දකෝෂය විලාසිතා යන්න හඳුන්වා දෙන්නේ පහත පරිදිය (2003).

ක්‍රියාව - විලාසිතාව යනු හැඩගැස්වීම, තැනීම නිර්මාණය කිරීමයි.

නාම පදය - ආකාරය, හැඩය, අන්දම, මෝස්තරය, තාලය, සිරිත, ව්‍යවහාරය යන්න විලාසිතා ලෙස හැඳින්විය හැකිය.

ප්‍රංශ දාර්ශනිකවාදියකු වන "ගිල්ස් ලිපොවෙට්ස්කයි" (Gilles Lipovertsky) විසින් රචිත The Empire of Fashion, Dressing Modern Democracy (1994) යන කෘතිය මගින් විලාසිතා සමග බද්ධව පවතින දාර්ශනික පසුබිම පිළිබඳව සාකච්ඡා කෙරේ.

"ඔබ විලාසිතාවක් අනුගමනය කළත් නැතත් ඔබ පිළිබඳව සහ ඔබගේ දේශපාලනික ප්‍රකාශයන් කෙරෙහි විශ්වාසයන් ඇති කරවීමට තරම් ඇඳුම්වලට ඔබට, ඔබගේ ජීවිතයට බලපෑමක් සිදුකළ හැකිය. එමෙන්ම සැප පහසුව එදිනෙදා කාර්යවලියන්හි නිරත වීමට ඇඳුම් උපකාරි වේ. ඒ අනුව වත්මන් සමාජයට විලාසිතා ඉතා ප්‍රයෝජනවත් වෙයි. (E. krelius)


"සොලමන් (Solaman-2007)" නැමැති විලාසිතා නිර්මාණ ශිල්පියා විලාසිතා හඳුන්වන්නේ,

"මනෝ විද්‍යාත්මකව විලාසිතා පෞද්ගලිකත්වය පිළිබඳව විවරණය කරයි. සමාජ විද්‍යාත්මකව සමාජ පන්ති තරඟය සහ සමාජ සමානකමත්, ආර්ථික විද්‍යාවට අනුව ලුහුබැඳයාමත් , සෞන්දර්යවාදීන්ට අනුව නිර්මාණාත්මකව සහ සුන්දර අදහසුත් ඉතිහාසඥයන්ට අනුව ක්‍රමයෙන් වෙනස්වන සමාජය විවරණය කිරිමක් ලෙසටද එහි වෙනස්කම් දැන්වීමක් ලෙසටද විලාසිතා හඳුන්වාදිය හැකිය".

විලාසිතා නගර නිර්මාණය වීම දක්වා ගෝලීයකරණය තුළ විලාසිතාකරණය අතිශය නව්‍යකරණයට බඳුන් වී තිබේ. එමෙන්ම මානව විලාසිතා සැම විටම පුද්ගල, ආකල්ප, අගයන් විශ්වාසයන් ඇති කිරීම, පවත්වා ගැනීම මෙන්ම, ස්ථිර කිරීම ආදී සියල්ල සමග සහසම්බන්ධතාවයක් දක්වයි. "ඇඳුම ආකල්ප, අගයන්, විශ්වාසයන් කෙරෙහි බලපෑම් කරන බව" Nancy Rudd සහ Sharron Leeou (2000) දී සිදුකරනු ලැබූ පර්යේෂණයෙන් සොයා ගන්නා ලදී.

සමාජ මනෝ විද්‍යාව හා විලාසිතා පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන අන් ප්‍රධානතම ලක්ෂණය නම් ඇඳුම් මිනිසාගේ ශරීර අභිමානය මෙන්ම අගතීන් සමාජයට පිළිබිඹු කිරීමට දක්වන ලබන සමර්ථභාවයයි. "පුද්ගලයන් තුළ ස්වයං ආකල්ප, හැසිරීම් ආදිය පෞද්ගලිකවම සමාජය කෙරෙහි ඉදිරිපත් කිරීමට ඇදුම්වලට විශේෂ හැකියාවක් පවතී". -සැලී ෆ්‍රැන්සිස් 1992-

මෙමගින් "සැලී" වැඩි වශයෙන්ම ඇඳුම මඟින් නිරූපණය කරන චර්යාවන් 02 ක් කෙරෙහි අවධානය යොමු කරයි. ඒ ඔස්සේ ඇඳුම උසස් හා පහත් වශයෙන් පුද්ගල ආකල්ප ගොඩනැංවීමේ කාර්යයෙහිලා බලපෑම් කරන බව පෙන්වා දෙයි.




විවිධ පර්යේෂකයන්ගේ නිගමනයන්වලට අනුව ඇඳුම සාමාජීය වශයෙන් ජීවත්වන පුද්ගලයන්ගේ අදහස් කෙරෙහි සංඥාර්ථ උද්දීපනය කරමින් බලපෑම් කරන බව සොයා ගෙන ඇත.

## සමාජ මනෝ විද්‍යාව

සමාජ මනෝ විද්‍යාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ එහි සුවිශේෂී යොමුවීම පුද්ගලයින්ගේ චර්යා රටා විශ්ලේෂණය කිරීම කෙරෙහි දිශානුගතවන බවයි. "සමාජ මනෝ විද්‍යාව සමාජ සන්දර්භය තුළ පුද්ගලයින් පිළිබඳව අධ්‍යයනය කරයි". -මනෝවිද්‍යාඥ ගෝල්ඩන් ඕල්පොට් -(1985)-

සමාජය තුළදී විවිධ ඇඳුම්-පැලඳුම් මඟින් විවිධ සංඥා සංකේත උද්දීපනය වෙයි. එමෙන්ම පුද්ගලයින්ගේ තරාතිරම උස් පහත් භාවය පිළිබඳ අවධානය ලබා ගැනීමටද මෙහිදී ඇඳුම්-පැලඳුම් සමත්වෙයි.

උදා :- පාසැල් ශිෂ්‍යයා, ගුරුවරයා, පොලිස් නිලධාරියා, වෛද්‍යවරයා, නීතිඥයා, ආදී විවිධ භූමිකා හඳුනා ගැනීමට මෙකී ඇඳුම් මගින් හැකියාව ලැබේ.

"අම්බර්ටෝ එකෝගේ" සංඥාර්ථවේදී විග්‍රහයේදී ඔහු සංඥා වර්ග 02 ක් යටතේ විග්‍රහ කරයි. ඒ,

01. ස්වභාවික සංඥා හා

02. කෘතිම සංඥා

යනාදී වශයෙනි. මෙහිදී ඔහු වැඩිදුරටත් කෘතිම සංඥා වර්ග 02 ක් යටතේ නැවත හඳුන්වා දෙයි. ඔහුගේ අර්ථදැක්වීමට අනුව සංඥාවක් මඟින් එක්සත් කෘත්‍යයන් හදුන්වාදීමක් පිළිබඳව විවරණය කරයි.

උදා - "පොලිස් නිල ඇඳුම් දුටු පසුව සාමාජීය සේවාවක් සිහියට නැගේ. එය එක්සත් කෘත්‍යයන් හඳුන්වා දීමකි".

මේ ආකාරයට විලාසිතා එක් අවස්ථාවකදී සාමාජීය වශයෙන් පුද්ගලයා කෙරෙහි මනෝවිද්‍යාත්මකව සංඥාර්ථ උද්දීපනය කරමින් ක්‍රියාත්මක වෙයි.

## සංඥාර්ථවේදය

සංඥාර්ථවේදයේදී සිදුකරනු ලබන්නේ සංඥාර්ථ සහ සංඥාර්ථ බලපැවැත්වෙන සමාජයක් එහි බලපෑමත් අධ්‍යයනය කිරීමයි. සංඥාර්ථවේදයේදී වචනවල භාවිතය, ශබ්දයේ සහ තානයේ භාවිතය දේහ චලන හා සත්ත්ව සන්නිවේදනය පිළිබඳව අධ්‍යයනය කිරීම ද සිදුකරනු ලබයි. එම වදන An Essay Concerning Human Understanding 1960 යන ග්‍රන්ථයේදී "Semeiotike" සහ " Semiotics" යන ආකාරයට භාවිත කරනු ලැබීය. සංඥාර්ථවේදය දර්ශනයට හඳුන්වා දෙනු ලැබුවේ 17 වන සියවසේ "ජෝන් ලොක්" විද්වතා විසිනි. මේ වදන බහුල වශයෙන් ව්‍යාප්ත වන්නට හේතු වූයේ ඇමෙරිකානු දාර්ශනික "චාල්ස් පියර්ස්" හා ඇමෙරිකානු වාග් විද්‍යාඥ "චාල්ස් මොරිස්ගේ" ක්‍රියාකාරකම් හේතුවෙන්ය. චාල්ස් මොරිස් සංඥාර්ථවේදය කොටස් තුනක් යටතේ විග්‍රහ කළේය.

01. Pragamatics - සංඥා භාවිත වන ක්‍රමයට අදාළ දේ මීට ඇතුළත්ය.
02. Semiotics - සංඥා හා ඒවායේ අර්ථ අතර සම්බන්ධයට අදාළ දේ
03. Syntax - සංඥා ඒවායේ අර්ථවලින් බැහැරව ක්‍රියාත්මක වීම


සංඥාර්ථවේදය බලවත් අවධානයක් යොමුකරනු ලබන්නේ සංඥාවක් සහ සංඥා මගින් ඇති කරනු ලබන අර්ථ පිළිබඳවය. ඒ ඔස්සේ සමස්ත ව්‍යවහාර භාෂාවේ පවතින වචන සේම අභිනයන් ඔස්සේ ද සංඥාර්ථ අධ්‍යයනය කිරීම සිදුකළ හැකිය.

''සංඥාර්ථවේදය බලවත් සැලකිල්ලක් දක්වනු ලබන්නේ සංඥාවන් පිළිබඳව සියල්ල තේරුම් ගැනීමටය. සංඥාවන් විසින් පිහිටවනු ලබන මුද්‍රිත සහ කතාකරනු ලබන වචනවලත් රූපවලත්, හඬෙහිත්, අභිනයන් සහ අදහස් කරන සියල්ලෙහි සංඥාවේ අර්ථ දැක්වීම් අධ්‍යයනය සිදුකිරීම සංඥාර්ථවේදයේදී සිදු කරයි.'' - Umberto Eco (1976) -

සංඥාර්ථ විද්‍යාව සංඥා විද්‍යාත්මක විග්‍රහය සඳහා පළමුකොට භාවිත කරනුයේ ස්විට්සර්ලන්ත වාග් විද්‍යාඥ "ෆර්ඩිනන්ඩ් ද සෝසුර්" (Ferdinand De Squssure - 1857 - 1913) විසිනි. ඔහුගේ විග්‍රහයේදී ඔහු සංඥාව ප්‍රධාන කොටස් දෙකක් යටතේ බෙදා දක්වීය.

1. Signifier
2. Signified ලෙසටය.

"සාවුෂර්" සංඥාවන්හි ක්‍රියාන්විතය රූප සටහනකින් දක්වන්නේ මෙසේය.




මෙහිදී සංඥාකාරකය ලෙස හඳුන්වනු ලබන්නේ යම්කිසි ප්‍රතිරූපයක, වස්තුවක හෝ ශබ්දයක පවතින ද්‍රව්‍යමය ස්වභාවයයි. ''එනම් මෙහි ''ගස'' යන වචනය සංඥාකාරකයයි. සංඥාකෘතය යනු ''ගස'' යන්න කියූ සැනින් මතකයට නැගෙන රූපයයි. එනම් සංඥාකාරකය මගින් නියෝජනය කරනු ලබන සංකල්පයයි. මෙම සංඥාර්ථ විද්‍යාවේදී සංඥාකාරකය සහ සංඥාකෘතය එකිනෙකට වෙනස් කළ නොහැකිය. ''කතා ව්‍යවහාරයෙහි පවත්නා හඳුනා ගැනීමේ භාෂිතය සංඥාවයි. සංඥාව සංඥාකාරකය සමග බැඳී ඇත. සාවුෂර් තමා විසින්ම ඇතැම් විට භාවිතයට අදාළ සංඥාව සංඥාකාරකයේ දී භාවිත කරයි. (Wells 1947)

මෙම සංඥාකාරකය හා සංඥාකෘතය අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කිරීමේදී ''වර්ෂාව'' යන්න සංඥාවක් ලබාදුන් පසුව එය ග්‍රහණය කරගත් තැනැත්තා ඒ පිළිබඳව සිතයි. එවිට වර්ෂාව යන්න මගින් නියෝජනය කරන අහසින් වැටෙන ජලය පිළිබඳව අදහසක් ගම්‍ය වෙයි. එය සංඥා කෘතයයි. එම සංඥා කෘතයට විවිධ අරුත් ජනිත කිරීමේ හැකියාවක් ද සහිතය. ''වැස්ස'' යන්න සංඥාකෘතය ලබාදීම උදෙසා භාවිතකර තිබෙන භාෂාවේ භාවිත වචනය සම්මත වී පණිවිඩය ප්‍රතිග්‍රහණය කිරීමේදී එම වචනය ඔස්සේ සිතයි. එමෙන් සංඥා කෘතයට ද අර්ථ ජනනය කළ හැකිය. එමගින් ''වැස්ස'' ජල බිංදු කිහිපයක් අහසින් වැටෙන වැස්සට අමතරව, අධික වැස්ස, හිම වැස්ස ආදී අරුත් ද ජනනය කරයි. ඊට අමතරව මද වැස්ස, මොර සූරන වැස්ස ආදී ලෙසට ද සංඥාකෘතයට විවිධාකාරව ප්‍රතිනිර්මාණය විය හැකිය.

භාෂාව සතුව පවතින බහු අර්ථ සහිත බව මෙහිදී ප්‍රධාන වශයෙන්ම බලපායි. සංඥාර්ථවල බලපෑම ඒ ඒ චින්තන රටා ඔස්සේත්, විවිධ රටවල්වලට විවිධ ආකාරයට සේම ඒ ඒ ප්‍රදේශවලදී විවිධ අරුත් ජනිත කළ හැකිය.

## විලාසිතාකරණය සමාජ මනෝවිද්‍යාව සහ සංඥාර්ථ

විලාසිතා යන ඕනෑම ආකාරයක අඳින සහ පලඳින ආකාර කෙරෙහි සමාජ මනෝවිද්‍යාත්මක සාධක ඍජුවම බලපෑම් කරන ආකාරය පෙනීයයි. ජනතාව තමන් ගැන සිතන ආකාරය පිළිබඳ අදහස

කෙරෙහිද මෙකී ඇඳුම් සැමවිටම බලපෑම්කාරීය. පුද්ගල ආකල්ප ගොඩ නැංවීමේ ක්‍රියාවලිය සඳහා එය එක් අතකින් ප්‍රබල ලෙසට බලපෑම් කරයි." ඇඳුම අපගේ අදහස් කෙරෙහි බලපෑම් කරයි."
-Betti Hannover and Ulrich Kuhnen ( 2002)-

සමාජ මනෝ විද්‍යාව තුළදී වැඩි වශයෙන්ම බහු සංස්කෘතිකවාදය යන ලක්ෂණය කෙරෙහි පූර්ණ අවධානය යොමු විය. එයට හේතුව සමාජය තුළ බහු සංස්කෘතික ලක්ෂණ උද්ගතවීමයි. මෙහිදී ස්වයං ආකල්ප යන කාරණය කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ තුළ බහු සංස්කෘතිකවාදී ලක්ෂණයන්ට අදාළව සමාජ මනෝවිද්‍යාව අධ්‍යයනය කිරීම සිදු කරයි.

"ඩෙස්මන්ඩ් මොරිස්" විග්‍රහ කරන්නේ සමාජ සංඥා සම්ප්‍රේෂණයෙන් තොරව ඇඳුම් ඇඳීමට නොහැකි බවයි. "රෝලන්ඩ් බාර්ත්ගේ" අර්ථදැක්වීමට අනුව පුද්ගලයාගේ මතවාදීමය සාධක අධ්‍යයනය කිරීමේදී ඇඳුම්-පැලඳුම් ස්වරූප භාවිතයට ගත හැකිය. එනම් පුද්ගල මතවාදය ඇඳුම තුළින් යම් ආකාරයකට සම්ප්‍රේෂණය වන බව ඔහු පෙන්වා දෙයි.

## නිගමනය

විලාසිතා යනු පුද්ගලයන්ගේ සමාජීය සාධක කෙරෙහි ප්‍රබල වශයෙන් පාදක වන ප්‍රපංචයකි. ඇඳුම් සෑම විටම පුද්ගලයාව බාහිරව මෙන්ම අභ්‍යයන්තරවද විමර්ශනය කළ හැකි සාධකයකි. ඇඳුම් මඟින් උද්දීපනය වන සංඥාර්ථ මඟින් මිනිසුන් මිනිසුන් අතර නිර්වාචික සන්නිවේදනයක් සිඳුවෙයි. ඒ ඔස්සේ පුද්ගලයාගේ සමාජ තත්ත්වය, පන්ති විශමතාවය, පන්ති භේදය මෙන්ම පුද්ගලයාගේ ඇතැම් අභ්‍යයන්තරික ලක්ෂණ පවා සංඥාර්ථ ගැන්වීමට විලාසිතාකරණයට ප්‍රබල හැකියාවක් පවතී. විලාසිතා යනු සමාජ මනෝ විද්‍යාත්මක සාධක මැනවින් විවරණය කළ හැකි විෂය ක්ෂේත්‍රයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Allport, G. (1985). The Historical Background of Social Psychology. In G. Lindzey & E. Aronson (Eds)., The Handbook of Social Psychology. New York: Random HouseBehling, D., & Williams, E. A. (1991). Influence of Dress on Perception of Intelligence and Expectations of Scholastic Achievement. Clothing and Textiles Research Journal, 9(4), 1–7. Davis, L. L. (1984). Clothing and Human Behavior: A Review. Home Economics Research Journal.

Barthes, Roland ([1964] 1967).Elements of Semiology.(Translated by Annette Lavers & Colin Smith). London: Jonathan Cape

Barthes, Roland. ([1957] 1987).Mythologies. New York: Hill & Wang.

Berger,Arther Asa,(2010).The object of Affection Semiotics and consumer culture;Palgrave Macmilian,United state.

Berger,Arthur,Asa.(1933).Media analysis techniques.Sagepublication,United Kingdom.

Chandler, Daniel.(2001/2007). Semiotics: The Basics. London: Routledge

Chandler,Daniel, Analysis of Advertisements.http : //www.wber.ac.uk/media/modules / mainTV/ analad.html.

Clarke, D. S. (1987).Principles of Semiotic. London: Routledge&Kegan Paul.

Danesi,Mrcel;(2004).Messages signs and meanings;Canadian scholars press Inc,toronto,Ontario.

Johnson, K.K.P., Yoo, J., Kim, M., & Lennon, S.J. (2008). Dress and Human Behavior: A Review and Critique. Clothing and Textiles Research Journal.

Johnson, K.K.P., & Roach-Higgins, M. E. (1987). Dress and Physical Attractiveness of Women in Job Interviews. Clothing and Textiles Research Journal.

Johnson, K.K.P., Hegland, J. E., & Schofield, N.A. (1999). Survivors of Rape: Functions and Implications of Dress in a Context of Coercive Power. In K. K. P. Johnson & S. J. Lennon (Eds), Appearance and Power,Oxford: Berg. DOI: http://dx.doi.org/10.2752/9781847887221/AANDPOWER0005

Morris,Desmond.(2011).The Naked Women: a study of the femail body, Vintage Digital.